## දිවුලපිටිය ප්‍රාදේශීය සභාව.

## ගම්පහ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 20 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 24 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජුනි 17 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අවලංගු කරතිබූ ව්‍යාපෘති 04ක ඇස්තමේන්තුගත පිරිවැය රු.2,300,000 ක හිඟ හිටි වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි..

(ආ) 2011 වර්ෂයේ දි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර ගිවිසුම්වලට එළඹ නොතිබූ ව්‍යාපෘත 14 ක ඇස්තමේන්තුගත පිරිවැය රු.8,639,907 ක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ දි සභාවට පවරා ගෙනතිබූ කැකුණගහලන්ද ඉඩමේ වටිනාකම වූ රු.951,165ක් ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි ආයුර්වේද බෙහෙත් තොගයේ වටිනාකම වූ රු.383,080 ක් ගිණුම්ගත කර නොතිබූ අතර, වර්ෂය තුළ මිල දි ගෙන තිබූ බෙහෙත්වල වටිනාකම වූ රු.625,000 ක් ආදායමට එරෙහිව ලියා හැර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.97,435,975 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 නිරවුල් නොකළ ගිණුම්

අත්තිකාරමක් දෙන ලද කාර්යය නිම කළ විගසම පියවියයුතු වුවත් රු.5,442,801 ක් වූ අත්තිකාරම් 2013 පෙබරවාරි 19 දින වන විටත් පියවා නොතිබුණි

2. **<u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵලය</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.28,824,949 ක් වූ අතර, ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,867,075 ක් විය.

2.2 **<u>ආදායම් පරිපාලනය</u>**

2.2.1 **<u>ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>**

සමාලෝචිත වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

2.2.2 **<u>මුද්දර ගාස්තු</u>**

2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් සභාවට අයවිය යුතු මුද්දර ආදායම ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 <u>වරිපනම් බදු</u>

(අ) 2007 පෙබරවාරි 09 දිනැති ගැසට් පත්‍රයේ පලකර තිබූ නිවේදනයක් මගින් දිවුලපිටිය සභා බල ප්‍රදේශය දියුණ කළ ප්‍රදේශයක් බවට දක්වා තිබුණි. ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශිත ප්‍රදේශවල නිශ්චල දේපළක වාර්ෂික වටිනාකම මත සභාව විසින් වරිපනම් බද්දක් නියම කළයුතු වුවත්, සභා බලප්‍රදේශයේ ඇති ග්‍රාම නිලධාරි වසම් 123 න් වසම් 15කින් පමණක් වරිපනම් බදු අය කර තිබුණි.

(ආ) 2008 වර්ෂයේ තක්සේරු ප්‍රතිශෝධනය අනුව වැඩිපුර බිල් කළ වරිපනම් වටිනාකම් රු.4,197,906 ක් 2011 ජුනි මාසයේ ගෙන තිබූ සභා තීරණය පරිද හිඟ හිටි වරිපනම් බදු ගිණුමෙන් කපා හැර තිබූ අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව ඒ සඳහා අමාත්‍යවරයාගේ අනමැතිය ලබා ගෙන නොතිබිණි.

2.3 <u>අය වැය ලේඛනමය පාලනය.</u>

වැය ශීර්ෂ 05 ක ප්‍රතිපාදන ඉක්මවා රු.32,827,742 ක වැය කර තිබුණද සභා අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

3. **<u>පද්ධති හා පාලන.</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය.

(ආ) අභ්‍යන්තර විගණනය.

(ඇ) මූල්‍ය පාලනය.

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) තොග පාලනය.

(ඊ) වත්කම් කළමනාකරණය.